# ගිණුම්කරණය

## අධ්‍යයන පොදු සහතික පත්‍ර උසස් පෙළ විභාගය සඳහා විෂයානුබද්ධ සංචිතය

## 01 ගිණුම්කරණය හා එහි අවශ්‍යතාව විග්‍රහ කරයි - බහුවරණ සහ කෙටි ප්‍රශ්න

නිවැරදි පිළිතුර තෝරන්න.

1. ගිණුම්කරණයේ ප්‍රධාන අරමුණ වන්නේ,
   (1) ගිණුම්කරණ ඒකකයට අදාල තොරතුරු ගිණුම් පොත් වල වාර්තා කිරීම.
   (2) ගිණුම්කරණ ඒකකය පිළිබඳ තීරන ගැනීමට කළමණාකරුවන්ට අවශ්‍ය තොරතුරු සැපයීම.
   (3) අතීත ගණුදෙනු හා සිද්ධීන් වලට අදාල තොරතුරු ආර්ථිකමය තීරණ ගැනීමට සුදුසු වන ආකාරයට සකස් කිරීම.
   (4) ආයතනයක සියළුම කළමණාකරණ මට්ටම් වලට අවශ්‍ය වන පරිදි මූල්‍ය හා මූල්‍ය නොවන තොරතුරු සැපයීම
   (5) ගිණුම්කරණ ඒකකය පිළිබඳ උනන්දුවක් දක්වන පාර්ශවයන්ට තීරණ ගැනීම සඳහා අවශ්‍ය වන්නා වූ ආර්ථික තොරතුරු සන්නිවේදනය කිරීම.

2. රාජ්‍ය ආයතන ව්‍යාපාරයක් සම්බන්ධයෙන් ඇල්මක් දැක්වීමට අදාළ නොවන කරුණු වන්නේ පහත කුමන කරුණුද?
   A. නියමිත පරිදි බදු ගෙවන්නේද යන්න දැන ගැනීම
   B. සැලසුම් නිසි පරිදි ක්‍රියාත්මක කර ඇත්ද යන්න දැන ගැනීම
   C. සාධාරණ මිලකට ගුණාත්වයෙන් යුතු නිශ්පාදන ලබා දෙන්නේද යන්න දැන ගැනීම
   D. වැටුප් වැඩි කිරීමට ව්‍යාපාරයට හැකියාවක් තිබේ ද යන්න දැන ගැනීම

   (1) A හා B
   (2) B හා C
   (3) C හා D
   (4) A හා C
   (5) B හා D

3. පහත දී ඇති ප්‍රකාශ සත්‍ය ද අසත්‍ය ද යන්න දක්වන්න.
   (1) ගිණුම්කරණ ඒකකයක ආර්ථික තොරතුරු ලෙස හඳුන්වන්නේ මූල්‍යමය වශයෙන් මැනිය හැකි තොරතුරුය. ( )
   (2) ඓතිහාසික හා පුරෝකථන තොරතුරු සැපයීම මූල්‍ය ගිණුම්කරණය මඟින් සිදුවේ. ( )

(3) කළමනාකරණ ගිණුම්කරණයේ නිමැවුමක් ලෙස පොදුකාර්ය විභජන පත්‍රිකා ලබා ගත හැකිය. ( )

(4) ගිණුම්කරණ යෙදවුම් ලෙස ගණුදෙනු හා සිද්ධීන් හඳුනා ගත හැකිය. ( )

4. හිස්තැන් පුරවන්න.

(1) සමාජයේ සිටින පුද්ගලයින්ගේ සිතුම්, පැතුම් හා ආකල්ප සහිත වටපිටාව ................................... පරිසරය ලෙස හැඳින්වේ.

(2) බාහිර හා අභ්‍යන්තර පාර්ශවයන්ට අවශ්‍ය තොරතුරු සැපයීම ................................ ගිණුම්කරණය මඟින් සිදුවේ.

(3) ආයෝජන තීරණ ගැනීමේ තොරතුරු ........................................ ගිණුම්කරණයේ නිමවුමක් ලෙස ලැබේ.

(4) දෙපාර්ශවයක් අතර හුවමාරුවක් සිදු නොවුවද, ව්‍යාපාරයේ වත්කම්, වගකීම්, හිමිකම් කෙරෙහි බලපෑමක් ඇතිවන මුදලින් මැනිය හැකි දෑ ............................................. වේ.

5. ගිණුම්කරණ ක්‍රියාවලිය පිළිවෙලින් දැක්වෙන වරණය තෝරන්න

A. ලෙජර් ගිණුම් තුලනය කර, ශේෂ පිරික්සුමක් පිළියෙල කිරීම.

B. ව්‍යාපාරයක ගණුදෙනු හා සිද්ධීන් මුදල් මාධ්‍යයෙන් මැනීම.

C. මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීම.

D. මූලාශ්‍ර ලේඛන පදනම් කරගෙන මූලික සටහන් පොත් වල වාර්තා කිරීම.

E. මූලික සටහන් පොත්වල ඇතුලත් කළ දෑ ලෙජරයට පිටපත් කිරීම.

(1) A, B, C, D, E

(2) B, A, E, D, C

(3) B, D, E, A, C

(4) D, B, E, A, C

(5) D, E, C, B, A

6. කළමණාකරණ ගිණුම්කරණ තොරතුරු ඉදිරිපත් කිරීමේ දී මූල්‍ය ගිණුම්කරණයෙන් වෙනස් වන්නේ,

(1) ඇල්මක් දක්වන සියළු පාර්ශව වලට තොරතුරු සැපයීම.

(2) අතීත සිද්ධීන් ඇසුරෙන් පමණක් තොරතුරු සැපයීම.

(3) බාහිර පාර්ශවයන්ගේ අවශ්‍යතා මත පමණක් තොරතුරු ඉදිරිපත් කිරීම.

(4) අතීත හා ඇස්තමේන්තු ගත තොරතුරු පදනම් කර වාර්තා ඉදිරිපත් කිරීම.

(5) ගිණුම්කරණ ප්‍රමිත හා නෛතික අවශ්‍යතාවයන්ට අදාලව ගිණුම්කරණ තොරතුරු ඉදිරිපත් කිරීම.

7. මූල්‍ය ප්‍රකාශන පරිශීලකයෙක් ලෙස අයෝජකයන්ගේ ප්‍රධාන අරමුණක් නොවන්නේ,

(1) ආයෝජනය හා සබැඳි අවදානම හා ප්‍රතිලාභ පිළිබඳ ඇගයීම.

(2) ආයෝජනයේ ඵලදායීතාවය පිළිබඳ ඇගයීම.

(3) ප්‍රතිලාභ ගෙවීම පිළිබඳ හැකියාව දැන ගැනීම.

(4) කළමණාකාරීත්වය, භාරකාරීත්වය හා ගිණුම් කටයුතුභාවය පිළිබඳ තක්සේරු කිරීම.

(5) ආයෝජනයේ සුරක්ෂිතභාවය තහවුරුවේද යන්න දැන ගැනීම.



වාණිජ හා ව්‍යාපාර අධ්‍යයන අංශය

8. වර්තමානයේ දේශීය ආහාර පරිභෝජනය සඳහා ජනතාව වැඩි නැඹුරුවීමේ වුවමනාවක් ඇති වීම නිසා එම කාර්යයේ නිරත ව්‍යාපාර වල වෙළඳපල ප්‍රසාරණය වී ඇත. මීට බලපා ඇති පරිසර සාධකය වනුයේ,

(1) තාක්ෂණික පරිසරය
(2) ආර්ථික හා දේශපාලන පරිසරය
(3) ශිල්පීය හා වෘත්තීය පරිසරය
(4) සමාජ හා සංස්කෘතික පරිසරය
(5) නෛතික පරිසරය

9. ලෝකයේ පවතින වසංගත හා ස්වභාවික ආපදා තත්වය මත විදේශීයව මෙන්ම දේශීයව මාර්ග ගත ක්‍රමයට ගණුදෙනු කිරීමට ජනතාව පෙළඹී ඇත. මේ සඳහා බලපා ඇති පරිසර සාධක වන්නේ,

(1) ශිල්පීය හා වෘත්තීය පරිසරය
(2) ආර්ථික හා දේශපාලන පරිසරය
(3) තාක්ෂණික පරිසරය
(4) නෛතික පරිසරය
(5) සමාජ හා සංස්කෘතික පරිසරය

10. පහත සඳහන් තොරතුරු භාවිතා කරන ඇල්මැති පාර්ශව නම් කරන්න.

| තොරතුරු | ඇල්මැති පාර්ශව |
|---|---|
| (1) සමාගම කාලච්ඡේදය වෙනුවෙන් බෙදා හැරීමට යෝජිත ලාභාංශ ප්‍රමාණය | ............................... |
| (2) ආයතනයේ නවීකරණය කරන ලද අංශයේ ඵලදායීතාවය | .............................. |
| (3) වර්ෂ අවසානයේ ගෙවීමට යෝජිත ප්‍රසාද දීමනා | ............................... |
| (4) ප්‍රතිඥාහාර සඳහා ගෙවා ඇති වටිනාකම | .............................. |